# බස්නාහිර පළාත් ලේකම්වරුන්ගේ රැස්වීම් වාර්තාව

| | | |
|---|---|---|
| දිනය | : | 2024.02.15 |
| වේලාව | : | ප.ව.2.30 |
| ස්ථානය | : | ප්‍රධාන ලේකම් රැස්වීම් ශාලාව |
| මූලාසනය | : | **එස්.එල්.ධම්මිකා කේ.විජයසිංහ මෙනවිය (ප්‍රධාන ලේකම්)** |

සහභාගී වූ නිලධාරීන්ගේ නාම ලේඛනය

| | | | |
|---|---|---|---|
| 01) | පී.සෝමසිරි මහතා | - | ආණ්ඩුකාර ලේකම් (බ.ප.) |
| 02) | තිලක් සෙනරත් මහතා | - | ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප) |
| 03) | යූ.බී.ආර්.රාජපක්ෂ මහතා | - | සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය (බ.ප) |
| 04) | සිරිසෝම ලොකුවිතාන මහතා | - | ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශ (බ.ප) |
| 05) | ඒ.ඩී.එස්.සදීකා මිය | - | ලේකම්,පළාත් පාලන අමාත්‍යාංශ (බ.ප) |
| 06) | ඩී.පී.වික්‍රමසිංහ මයා | - | ලේකම්,කෘෂිකර්ම අමාත්‍යාංශ (බ.ප) |
| 07) | කේ. වම්පා. එන්. පෙරේරා මිය | - | ලේකම්,ප්‍රවාහන අමාත්‍යාංශය ( බ.ප.) |
| 08) | එල්.ඒ.කළුකපුආරච්චි මයා | - | ලේකම්,සෞඛ්‍ය අමාත්‍යාංශ (බ.ප) / නියෝජ්‍ය ප්‍රධාන ලේකම්( වැ.බ) (පාලන) |
| 09) | ඩබ්ලිව්.ටී.ඒ.මානෙල් මිය | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |
| 10) | ඒ.එම්.එස්.මල්කාන්ති මිය | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) |
| 11) | ආර්.ඒ.පී.ආර්.රාමනායක මිය | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්)(රා.ආ.) |
| 12) | කේ.ආර්.අබේසිරිවර්ධන මහතා | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 13) | පී.පී.විජේවීර මිය | - | ප්‍රධාන අභ්‍යන්තර විගණක |
| 14) | පාලිත අබේවර්ධන මහතා | - | ප්‍රධාන නීති නිලධාරී |
| 15) | පේෂලා අබේසූරිය මිය | - | සහකාර ප්‍රධාන ලේකම් (පාලන) |
| 16) | නදීෂා ඩී. සපරමාදු මිය | - | සහකාර ප්‍රධාන ලේකම් (පාලන) |

21-A

ප්‍රධාන ලේකම්ගේ ප්‍රධානත්වයෙන් **2024.02.15** දින පැවති ලේකම්වරුන්ගේ රැස්වීමේදී සාකච්ඡා කල කරුණු හා එළඹි තීරණ පහත පරිදි වේ.

| අනු අංකය | කාරණය | තීරණය | ක්‍රියාත්මක කිරීමේ බලධාරියා |
|---|---|---|---|
| 01 | 2024 වර්ෂයේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම සම්බන්ධව | පළාත් සංවර්ධන සැලැස්මට අයත් පළාත් අමාත්‍යාංශ මට්ටමින් අනුමත කර ඇති ව්‍යාපෘති පිළිබඳ සාරාංශ විස්තරයක් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්)(රා.ආ) විසින් ඉදිරිපත් කරන ලදී.<br><br>පළාත් සංවර්ධන ප්‍රදාන අනුමත කිරීමේ දී දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ විශේෂ අනුමැතියක් ලබා ගැනීමේ අවශ්‍යතාවයක් නොමැති වන බවත් ද්විකරණ දෝෂ වලක්වා ගැනීම හා සම්බන්ධීකරණ කටයුතු වඩා කාර්යක්ෂමව කිරීම සඳහා අදාළ ව්‍යාපෘතිය අනුමත කිරීමේ දී දිස්ත්‍රික් ලේකම්වරු තිදෙනා වෙත (කොළඹ,ගම්පහ,කළුතර) ද පිටපත් සහිතව යොමු කිරීමට තීරණය කරන ලදී.<br><br>එසේම ව්‍යාපෘති අනුමත කර යොමු කිරීමේ දී අදාළ ව්‍යාපෘතියේ නම,ව්‍යාපෘතියේ වටිනාකම, ව්‍යාපෘතියේ මූලික තොරතුරු සඳහන් කිරීම ප්‍රමාණවත් වන බවත් දිස්ත්‍රික් ලේකම් වෙත යොමු කරනු ලබන ආවරණ ලිපියේ අනෙකුත් විස්තර ඇතුළත් කිරීම ප්‍රමාණවත් වන බව තීරණය කරන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්/ ඉංජිනේරු / මූල්‍ය) |
| 02 | මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ වාහන ලබා ගැනීම සම්බන්ධව | ආණ්ඩුකාර කාර්යාලය හා ඉංජිනේරු කාර්යාංශය සඳහා මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ වාහන ලබා ගැනීමට මුදල් අමාත්‍යාංශයේ අනුමැතියට යොමුකර ඇතත්, වියදම් පාලන චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ආණ්ඩුකාරවර කාර්යාලයේ ඉල්ලීම නිර්දේශ කල නොහැකි බවට දන්වා ඇති බව ද ඉංජිනේරු කාර්යාංශය වාහනය ලබා ගැනීමට මෙතෙක් මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය ලබා දී නොමැති වන බව ද අනාවරණය කරන ලදී.<br><br>ඒ අනුව වියදම් පාලන චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ අවශ්‍ය වාහන අවශ්‍යතාවය සපුරා ගත නොහැකි වන බැවින් මේ අවස්ථාව වන විට විසුරුවා ඇති පළාත් පාලන ආයතන වල ධුරධාරීන් වෙත වෙන් කර තිබූ වාහන සේවා අවශ්‍යතාවය මත තාවකාලිකව පවරා ගැනීම පිළිබඳ අවශ්‍ය කටයුතු සිදු කිරීමටත් අදාළ වාහන පිළිබඳ විස්තර පළාත් පාලන අමාත්‍යාංශය මඟින් ලබා ගැනීමටත් තීරණය කරන ලදී. | ලේකම්,පළාත් පාලන අමාත්‍යාංශය ( බ.ප.)<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/මූල්‍ය) |

21 - 8

| | | | |
|---|---|---|---|
| 03 | කාර්ය සාධන තරඟාවලිය හා වෙබ් අඩවි තරඟාවලිය | 2023 කාර්ය සාධන තරඟාවලියේ අඩු කාර්ය සාධනයක් පෙන්නුම්කළ ආයතන පවතින බැවින් හා තරඟාවලියේදී විනිශ්චය මණ්ඩලය විසින් හඳුනාගත් අඩුපාඩු පිළිබඳ අදාළ ආයතන දැනුවත් කිරීමටත්, තරගාවලිය සඳහා නව නිර්ණායක සම්පාදනය කිරීමටත් කටයුතු කිරීමට තීරණය කරන ලදී.<br><br>නිර්ණායක සකස් කිරීම මේ වනවිටත් සිදු කර ගෙන යමින් පවතින බැවින් එය කාල රාමුවක් යටතේ සිදු කිරීමටත් හඳුනා ගත් අඩුපාඩු පිළිබඳ පොදුවේ දැනුවත් කිරීමටත් තීරණය කරන ලදී.<br><br>මෙම තරඟාවලියට ඉදිරිපත් නොවී ඇති ආයතන විශාල ප්‍රමාණයක් පවතින බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ( පාලන) විසින් අනාවරණය කරන ලදී. ඒ අනුව ඉදිරියේ දී මෙම තරඟාවලිය පිළිබඳ පළාත් සභාවේ සමස්ත ආයතන පද්ධතියට මනා සන්නිවේදනය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමටත් තීරණය විය. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 04 | වෙබ් අඩවි යාවත්කාලීන කිරිම සම්බන්ධව | බස්නාහිර පළාත් සභාවේ ආයතනවල වෙබ් අඩවි යාවත්කාලීන කිරීමේ කටයුතු තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරිය වෙතින් සිදු කලයුතු බවට මාර්ගෝපදේශයක් ( විධානයක්) පවතින බැවින් බාහිර ආයතනයක් හෝ අදාළ ආයතනය ( අමාත්‍යාංශයේ හෝ දෙපාර්තමේන්තුවේ) තුළ සිටින විෂය සම්බන්ධ ප්‍රමාණික කුසලතා ඇති නිලධාරියකු ලවා මෙම කාර්යය භාරය සිදු කිරීමට බාධාවක් පවතින බව සාකච්ඡාවට බඳුන් විය.<br>ඒ අනුව මේ සම්බන්ධ විධානය නිකුත් කිරීමට අදාළ මූලාශ්‍ර තොරතුරු පරීක්ෂා කර බලා එම තීරණය සංශෝධනය කිරීමට අවශ්‍ය ඉදිරි ක්‍රියා මාර්ග ගැනීමට තීරණය කරන ලදී. | ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 05 | පාසල්වල සනීපාරක්ෂක කටයුතු සඳහා පහසුකම් සැලසීම | පාසල්වල සිසු දරුවන්ගේ සනීපාරක්ෂක කටයුතු වෙනුවෙන් ගොඩ නංවා ඇති ගොඩනැගිලි නඩත්තු කටයුතු මනා අධීක්ෂයක් යටතේ පවත්වාගෙන යාම අත්‍යාවශ්‍ය බැවින් මේ සඳහා පාසල තුලින් අභ්‍යන්තර ක්‍රමවේදයක් සකස් කර පවත්වාගෙන යාමට සියලු විදුහල්පතිවරුන් දැනුවත් කිරීමට තීරණය කරන ලදී. | ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය( බ.ප.) |

| | | | |
|---|---|---|---|
| 06 | සමූහ ජීවිත රක්ෂණාවරණය සම්බන්ධව | සමූහ ජීවිත රක්ෂණාවරණය සම්බන්ධව නිලධාරීන් දැනුවත් කර ඇති නමුත් මේ වන විටත් ඒ සඳහා ප්‍රමාණවත් පිරිසක් සම්බන්ධ වී නොමැති බැවින් පළාත් සභාවේ නිලධාරීන් මේ පිළිබඳ තවදුරටත් දැනුවත් කිරීම් පුළුල් කර මෙම රක්ෂණාවරණය සඳහා බඳවා ගැනීම් සිදු කිරීමට තීරණය විය. | සියලු ම අමාත්‍යාංශ ලේකම්වරුන් ( බ.ප.)<br><br>සියලු ම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් |
| 07 | අනුර බණ්ඩාරණායක රංග ශාලාවේ අයිතිය අත්තනගල්ල ප්‍රාදේශීය සභාව වෙත පැවරීම පිළිබඳ හා එහි ඉදිකිරීම් සම්බන්ධව | මෙම රංග ශාලාව අත්තනගල්ල ප්‍රාදේශීය සභාව වෙත පැවරීම පිළිබඳව ඉදිරිපත් වී ඇති යෝජනාව ඉදිරි කටයුතු සඳහා ගරු ආණ්ඩුකාරතුමාවෙත යොමු කිරීමට තීරණය කරන ලදී. | ලේකම්,<br>පළාත් පාලන අමාත්‍යාංශය / අධ්‍යාපන අමාත්‍යාංශය |
| 08 | මීගමුව විවිධ සේවා සමූපකාර සමිතියේ ඉදිකිරීමක ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධව | ප්‍රසම්පාදන පටිපාටි උල්ලංඝනය වීමක් සම්බන්ධ මෙම ගැටලුවේ වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කරන ලෙස දන්වන ලදී. | ලේකම්, ප්‍රවාහන හා සමූපකාර, අමාත්‍යාංශය ( බ.ප.) |
| 09 | බස්නාහිර පළාත් සභාව සතු නිල නිවාස හා ඉඩම් තොරතුරු යාවත්කාලීන කිරිම සම්බන්ධව | පළාත් සභාව සතු ඉඩම් හා ගොඩනැගිලිවල අයිතිය තහවුරු කර ගැනීම සඳහා ඒවා ගැසට් කිරීමට ගරු ආණ්ඩුකාරතුමා විසින් තීරණය කර ඇති බැවින් අයිතිය තහවුරු කිරීම සම්බන්ධව සපුරා ගතයුතු නෛතිකකමය අවශ්‍යතාවයන් බස්නාහිර පළාත් සභා ප්‍රඥප්ති සංශෝධනය හා නව ප්‍රඥප්ති සම්පාදනය හරහාත් කාර්යය භාරයක් සිදු කලයුතු වන බවට තීරණය විය. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු<br><br>ප්‍රධාන නීති නිලධාරී |
| 10 | ශ්‍රීමත් බාරොන් ජයතිලක විද්‍යාලයේ ගොඩනැගිල්ලේ ගැටළුව | එම ගොඩනැගිල්ල වඩාත් සුදුසු වන්නේ මේ වන විට එහි පවත්වාගෙන යනු ලබන ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශයට බැවින් එය එම අධිකාරිය භුක්තියට පවරා දීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස තීරණය කරන ලදී. | ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශ ( බ.ප.) |
| 11 | නාගරික සංවර්ධන අධිකාරියේ නාගරික සංවර්ධන කටයුතු සම්බන්ධව | නිවාස සැලසුම් අනුමත කිරිමේදී පළාත් පාලන ආයතනවලට අයත් ඉඩම් මෙගා පොලිස් සැලසුම් යටතේ සංවර්ධිත ඉඩම් ලෙස වෙන්කර ඇති බව හා ඒ අනුව සැලසුම් අනුමැතිය ලබා ගැනිමට නාගරික සංවර්ධන අධිකාරිය වෙත යාමට සිදු වීමේ ගැටළුවක් මතුවී ඇති බැවින් හා මෙම ගැටලුව නිරාකරණය කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය දැනටමත් ක්‍රියා මාර්ග ගනිමින් පවතින බව සාකච්ඡා විය. ඒ අනුව ඒ සම්බන්ධ අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන කඩිනම් විසඳුමක් ලබා දෙන ලෙස නාගරික සංවර්ධන අධිකාරිය වෙත දැන්වීමට තීරණය කරන ලදී. | ලේකම් ,<br>පළාත් පාලන අමාත්‍යාංශ |

21 - ව

| | | | |
|---|---|---|---|
| 12 | පළාත් පාසල්වල පවතින ගුරු පුරප්පාඩු පිරවීම | පසුගිය මාස කිහිපයකට පෙර ආරම්භ කරන ලද බස්නාහිර පළාත් සභාව සඳහා නව ගුරුවරුන් බඳවා ගැනීමේ ව්‍යාපෘතිය මේ අවස්ථාව වන විට පැන නැගී ඇති අධිකරණමය ක්‍රියාදාමයන් හේතුවෙන් තාවකාලිකව නැවතී පවතින බැවින් හා ඉදිරි සතියේ පැවැත්වෙන නඩු වාරයක දී මේ සම්බන්ධ තීරණය ප්‍රකාශයට පත් කිරීමට ඉඩ ප්‍රස්ථා ඇති බවට කරුණු සාකච්ඡා වූ අතර, එම තීරණ තීන්දු ප්‍රකාර ව ඒ සම්බන්ධ අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කිරීමට තීරණය විය. | ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව<br><br>ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශ ( බ.ප.)<br><br>ප්‍රධාන නීති නිලධාරි |
| 13 | අවසන් ගිණුම් ඉදිරිපත් කිරීම හා 2023 වර්ෂයේ ආයතන වල භාණ්ඩ සමීක්ෂණ කටයුතු | පළාත් සභාවේ ආයතන විසින් අවසන් ගිණුම් පිළියල කර පළාත් භාණ්ඩාගාරය වෙත 2024.02.29 දිනට පෙර ඉදිරිපත් කිරීමට කටයුතු කලයුතු වන අතර,පළාත් පාලන ආයතන පසුගිය වසරේ ද ගිණුම් ප්‍රකාශ ප්‍රමාදවී ඉදිරිපත් කරන ලද බැවින් ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කර අදාළ දිනට පෙර එම වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ( මූල්‍ය) දන්වන ලදී.<br><br>පළාත් සභාවේ තනිආයතන විසින් 2023 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය අවසන් කර ඒ පිළිබඳ වාර්තා 2024.03.16 දිනට පෙර ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස ද වැඩිදුරටත් දන්වන ලදී. | ලේකම්,පළාත් පාලන අමාත්‍යාංශය ( බ.ප.)<br><br>සියලුම අමාත්‍යාංශ ලේකම්වරු ( බ.ප.) |
| 14 | ලිපි ඉදිරිපත් කිරීමේ දී දෘඩ පිටපත් භාවිතය අවම කිරීම. | මේ සඳහා යොදා ගත හැකි සහ විධිමත් විකල්ප ක්‍රම වන QR කේත ක්‍රමය,විද්‍යුත් තැපැල ආදි වන ක්‍රම භාවිතය සුදුසුවන බව තීරණ කරන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු ( බ.ප.) |
| 15 | රාජකාරි වේලාව පිළිබඳව | පළාත් සභා සංකීර්ණයේ සමහර කාර්යාල වල සවස 3.45 පමණ කාලයෙන් පසු නිලධාරීන් කාර්යාලයේ රැඳී නොසිටින බවත්, එම කාලය තුළ දෛනික තැපෑලට හා අදාළ ලේකම්වරුන් වෙත යොමු කරනු ලබන ලිපි ආයතනික නිලධාරි විසින් භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හා මගහරින අවස්ථා පවතින බවට නිරීක්ෂණය කරන ලද බවත් ප්‍රධාන ලේකම් විසින් දන්වන ලදී.<br>ඒ අනුව කාර්යාලයේ සේවා කටයුතු පවත්වා ගතයුතු රාජකාරි කාලය පෙ.ව.8.30 සිට 4.15 දක්වා වන බවත්, එම කාලය තුළ අදාළ ලිපි භාර ගැනීම ඇතුළු රාජකාරි කටයුතු පවත්වා ගෙන යාම සඳහා කාර්යාල ක්‍රමය විධිමත් ව පවත්වා ගැනීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගන්නා ලෙස දැඩිව අවධාරණ කරන ලදී.<br><br>එසේම නිලධාරි ප්‍රවාහනය කරන ලබන බස් රථ, නිලධාරීන් නංවා ගැනීමට අංගනයේ ගාල් කිරීම සම්බන්ධයෙන් දැනටමත් උපදෙස් ලබා දී ඇති පරිදි ප.ව.4.15 පසුව සිදු කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමට තීරණය විය. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු ( බ.ප.)<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ( පාලන) |

| | | | |
|---|---|---|---|
| 16 | පළාත් රාජ්‍ය සේවයේ පත් කිරීම් හා උසස් කිරීම් පිළිබඳ. | සීමිත පදනමින් බඳවා ගැනීම් හා උසස් කිරීම සිදු කිරීම පිළිබඳ ආයතන මට්ටමින් පවත්නා පුරප්පාඩු හා අනෙකුත් විස්තර කැඳවීමක් පිරිස් හා පුහුණු අංශය මගින් සිදුකර ඇති බැවින් අදාළ තොරතුරු ඉදිරිපත් කරන ලෙස දන්වා ඇති ආකෘති මඟින් කඩිනමින් යොමු කිරීමට කටයුතු කරන ලෙස නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ( පිරිස් හා පුහුණු) විසින් දන්වන ලදී.<br><br>මෙම වර්ෂයේ මුල් කාර්තුවට අදාළ කාර්තු වාර්තා 2024.04.05 දිනට පෙර ඉදිරිපත් කළයුතු වන අතර අදාළ දිනයට පෙර එම වාර්තාව ඉදිරිපත් කිරීමට අපොසත් වුවහොත් පළාත් සභා නිලධාරින් වෙත වැටුප් ගෙවීම සඳහා ප්‍රතිපාදන ලබා ගැනීම නොහැකිවීමේ ගැටලුවකට මුහුණුපෑමට සිදුවිය හැකි බැවින් මේ සම්බන්ධයෙන් ප්‍රමුඛ අවධානය යොමු කර අදාළ දිනයට පෙර කාර්තු වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කිරීමට තීරණය විය. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු ( බ.ප.)<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ( පිරිස් හා පුහුණු/මූල්‍ය) |

වාර්තා කලේ : නදීෂා ඩී.සපරමාදු
සහකාර ප්‍රධාන ලේකම් (පාලන)

.............................................

එස්.එල්.ධම්මිකා කේ.විජයසිංහ,

ප්‍රධාන ලේකම්,

බස්නාහිර පළාත.

දිනය: 2024.02. [illegible]

එස්.එල්. ධම්මිකා කේ.විජයසිංහ
ප්‍රධාන ලේකම්
ප්‍රධාන ලේකම් කාර්යාලය (බ.ප)
204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල